සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) දිළිඳුකම තුරන් කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ ග්‍රාමීය ප්‍රජාවන් අතර ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික ඌනතා පිටුදැකීම;

(ආ) ජාති, කුල, ආගම් සහ ජනවාර්ගික විවිධත්වයන්හි වෙනස්කම් නොසලකා ග්‍රාමීය සහ වතුකර ප්‍රජාවන් අතර මිත්‍රත්වය, සාමය සහ සංහිඳියාව ඇති කිරීම ;

(ඇ) අධ්‍යාපන, ස්වයං රැකියා, වෘත්තීය පුහුණුව, කුඩා ව්‍යවසායකත්වය සහ අනෙකුත් සියලු සාධ්‍ය ක්‍රම මගින් ග්‍රාමීය සහ වතුකර ප්‍රජාවගේ සමාජ, ආර්ථික තත්ත්වය වර්ධනය කිරීම ;

(ඈ) කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාව, පශු සම්පත් සහ අනෙකුත් ග්‍රාමීය කර්මාන්ත සහ ගෘහස්ථ කර්මාන්ත දියුණු කිරීම සඳහා ව්‍යාපෘති පිහිටුවීම, පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සහ ඒ කර්මාන්ත සඳහා වෙළෙඳපොල අවස්ථා සොයාගැනීම ;

(ඉ) එක්සත්කම සහ අන්‍යොන්‍ය අවබෝධය තුළින් ග්‍රාමීය ශ්‍රමිකයන්ගේ සමාජීය තත්ත්වය වර්ධනය කිරීම සහ අඩු ආදායම්ලාභී කණ්ඩායම්වල සාමාජීය පසුබෑම අවම කිරීම ;

(ඊ) සමස්ත සංවර්ධනය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා කාන්තාවන් ඒකාබද්ධ කිරීම සඳහා ඔවුන් වෙනුවෙන් විශේෂ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම ;

(උ) ග්‍රාමීය හා වතු අංශය සඳහා මූල්‍ය උපකාර සැපයීම, බැංකු ණය පිළියෙල කිරීම සහ රජයේ සහනාධාර ලබා දීම ;

(ඌ) ග්‍රාමීය සහ වතු අංශයේ නිපුණතා වර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු, අධ්‍යාපන චාරිකා, දේශන සහ සාකච්ඡා සංවිධානය කිරීම, ශිෂ්‍යත්ව සහ ත්‍යාග ප්‍රදානය කිරීම, ක්‍රීඩා සහ සංස්කෘතික ක්‍රියාකාරකම් සංවිධානය කිරීම ;

